මගේ අංකය:-GA/1/3/Transfer 2024
පාලන 01,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.
2023.08.23

සියලුම,
අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)/ ප්‍රධාන මූල්‍ය නිලධාරි,
වාරිමාර්ග අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ (යාන්ත්‍රික)/ අධ්‍යක්ෂ (ITI-ගල්ගමුව) / ව්‍යාපෘති අධ්‍යක්ෂ
නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ,
ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු/ ප්‍රධාන නේවාසික ඉංජිනේරු,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු/ වාරිමාර්ග ඉංජිනේරු/ නේවාසික ඉංජිනේරු,
යාන්ත්‍රික ඉංජිනේරු/ භූ සම්පත් ඉංජිනේරු

**<u>වාර්ෂික ස්ථාන මාරුවීම් - 2024</u>**

**<u>ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය</u>**

2024-01-01 දින සිට ක්‍රියාත්මක වන වාර්ෂික ස්ථාන මාරු සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. **ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන හා නොකරන සියළුම ඉංජිනේරුවරුන් අමුණා ඇති ආදර්ශ අයදුම් පත්‍රය (ඇමුණුම 01)** අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් **<u>2023.09.08</u>** දින හෝ එදිනට පෙර තම ආයතන ප්‍රධානියා වෙත ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුවේ. එසේ අයදුම්පත්‍ර ඉදිරිපත් නොකරන නිලධාරීන් වෙතොත් ඔවුන් දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත ස්ථාන මාරුකිරීමට සිදුවනු ඇති අතර, එසේ ස්ථාන මාරු නියෝග ලබා දීමෙන් පසුව එම නිලධාරීන්ගෙන් ලැබෙන අභියාචනා සලකා බලනු නොලැබේ.

02. කලාප භාර වාරිමාර්ග අධ්‍යක්ෂ/ ව්‍යාපෘති අධ්‍යක්ෂ/ වාරිමාර්ග අධ්‍යක්ෂ (ITI-ගල්ගමුව)/ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු/ ප්‍රධාන නේවාසික ඉංජිනේරු හා ප්‍රධාන කාර්යාලයේ ආයතන ප්‍රධානීන් විසින් තම කලාපයේ/ ව්‍යාපෘතියේ/ අංශයේ සියළුම කාර්යාලවල ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන, නොකරන සියළුම ඉංජිනේරුවරුන්ගෙන් අයදුම්පත් ලබාගෙන එක් එක් කාර්යාලයට අයත් අයදුම්පත් වෙන් වෙන් වශයෙන් අංක යොදා මේ සමග ඇති **ඇමුණුම 02** ආකෘතියට අනුව උපලේඛන ගතකර ඒකාබද්ධ ලේඛනයක් වශයෙන් එක් ආවරණ ලිපියකින් **<u>2023.09.15</u>** දිනට පෙර මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. ඉල්ලුම්පත්වල ඇති තොරතුරු වල නිරවද්‍යතාවය ගැන ඔබ සෑහීමකට පත්විය යුතුය.

03. (a) ඇමුණුම 01 හි ඇති ඉල්ලුම්පත්‍රයේ 10 වැනි ඡේදය ප්‍රකාර, සේවයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු කරනු ලැබුවහොත් නිලධාරියා මාරුවී යාමට කැමති සේවා ස්ථාන තුනක් (03) මනාපය මත සඳහන් කර නොමැත්තේ නම් ඔවුන් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවයට කැමැත්ත ප්‍රකාශ කළා සේ සලකා කටයුතු කරනු ලැබේ.

(b) දැනට ස්ථාන මාරුවීම් ලබා ක්‍රියාත්මක වන දිනය විවිධ හේතූන් මත ප්‍රමාද කරගත් නිලධාරීන්ද අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර , ඒ බව අයදුම්පත්‍රයේ 07 (IV) වන ඡේදයේ සඳහන් කළ යුතුය.

(c) **පූර්ණ වෘත්තීය සුදුසුකම්** ලබා ගැනීමේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ස්ථාන මාරු ඉල්ලා සිටිනු ලබන නිලධාරීන් 11වැනි ඡේදයේ ඒ බව සඳහන් කර 13 වැනි ඡේදයේ අදාල විස්තර සැපයිය යුතුය.

(d) වසර 06 කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නමුත් පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා නොමැති නිලධාරීන් ද 13 වැනි ඡේදයේ අදාල විස්තර සැපයිය යුතු අතර ඔවුන් ස්ථාන මාරු ඉල්ලීමේදි සැලසුම් **කිරීමේ පුහුණුව ලබාගත හැකි සේවා ස්ථාන** සඳහන් කළ යුතුය.

04. ස්ථාන මාරු ඉල්ලුම්පත් මා වෙත ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් අවශ්‍යතාවන් සියල්ලම ඉටුවී ඇති බවට වග බලා ගන්නා ලෙසද විශේෂයෙන් දන්වමි.

a) සියළුම ඉංජිනේරුවරුන් අයදුම්පත් ඉදිරිපත් කරන බවට හා වත්මන් සේවා ස්ථානයට ස්ථාන මාරුවී පැමිණි දිනය නිවැරදිව සඳහන් කර තිබෙන බවට,

b) අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන උපලේඛණයේ සියළුම ඉංජිනේරුවරුන්ගේ නම් ඇතුලත් කර තිබෙන බවට,

c) 2024 වසරේ වැඩසටහන් පදනම් කරගෙන අවශ්‍ය වන ඉංජිනේරුවරුන්ගේ සංඛ්‍යාව සඳහන් කරඇති බවට,

d) වර්තමාන සේවා ස්ථානයේ අවුරුදු 05 කට වඩා සේවය කර ඇති සියළුම ඉංජිනේරුවරුන් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඇතුලත් කර ඇති බවට,

05. 2024 වසරට යෝජිත වැඩසටහන් පදනම් කරගෙන ඒ ඒ කාර්යාලවලට අවශ්‍ය ඉංජිනේරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන්ව නිශ්චිත වශයෙන් **ඇමුණුම 03** හි සඳහන් ආකෘති පත්‍රය අනුව ඉදිරිපත් කරන මෙන් සියළුම කලාප භාර වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, වාරිමාර්ග අධ්‍යක්ෂ(ITI-ගල්ගමුව), නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරුවරුන්, ප්‍රධාන නේවාසික ඉංජිනේරුවරුන් හා ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන්ගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිනු ලැබේ.

06. ඇමුණුම 1 ,2 සහ 3 හි දෘඩ පිටපත් අයදුම්පත් සමඟ සාමාන්‍ය තැපැල මගින් එවීමටත්, මෘදු පිටපත irrigationunit01@gmail.com ලිපිනයට විද්‍යුත් තැපැල මගින් යොමු කිරීමටත් කටයුතු කළ යුතුය.

07. වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත්‍රය, ඇමුණුම 1, 2 සහ 3 මෘදු පිටපත් වාරිමාර්ග දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර ඒ අනුව නිවැරදිව සකස් කරන ලද අයදුම්පත් මා වෙත යොමු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

A. Gunasekara.
ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

<u>පිටපත්</u> :-

01. ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය. - අමාත්‍යාංශය යටතේ රාජකාරි කරන නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉංජිනේරුවරුන්ගේ ස්ථාන මාරු අයදුම්පත් ලබා දීම සඳහා

02. අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා), රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.ස.
පුරවැසි, ස්වදේශ කටයුතු,

03. ලේකම්, වාරිමාර්ග දෙපාර්තමේන්තු ඉංජිනේරු සංගමය - කාරු. දැ.ගැ.ස.

ඇමුණුම 01

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුව ඇතුලත ස්ථාන මාරුවීම් - 2024 සඳහා අයදුම් පත්‍රය

ඉංජිනේරු සේවය

(අ) මෙම කොටස නිලධාරියා විසින් සම්පූර්ණ කල යුතුය.

01) සම්පූර්ණ නම :- ..............................................................................................

.............................................................................................. මයා /මිය/මෙනවිය

02) පෞද්ගලික ලිපිනය :- ..............................................................................................

..............................................................................................

03) උපන් දිනය :-

| වර්ෂය | | | | මාසය | | දිනය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

2023-12-31 දිනට වයස

| අවුරුදු | | මාස | | දින | |
|---|---|---|---|---|---|
| | | | | | |

04) තනතුර :- ..............................................................................................

(I) මුල් පත්වීමේ දිනය

| වර්ෂය | | | | මාසය | | දිනය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

(II) දැනට සිටින ශ්‍රේණිය :- IIIශ්‍රේණිය / II ශ්‍රේණිය / I ශ්‍රේණිය

05) (අ) විවාහක / අවිවාහක බව :- විවාහක ☐ අවිවාහක ☐

(I) විවාහක නම් කලත්‍රයා රජයේ සේවයේ නියුතුද ? ඔව් /නැත

(II) ඔහු /ඇය දරණ තනතුර හා සේවා ස්ථානය :- ..............................................................................................

..............................................................................................

(ආ) (I) ළමයින් ගණන හා ඔවුන්ගේ වයස :-

| ළමයාගේ නම | වයස |
|---|---|
| | |
| | |
| | |
| | |

(II) පාසල් යන ළමුන් ගණන හා ඔවුන්ගේ වයස :-

| ළමයාගේ නම | පාසැල |
|---|---|
| | |
| | |
| | |
| | |

06) භාෂා ප්‍රවීනතාවය :-

(අ) සිංහල ☐ (ආ) දෙමළ ☐ (ඇ) ඉංග්‍රීසි ☐

07) (I) වර්තමාන සේවා ස්ථානය :- ....................................................................................

(II) එයට ස්ථාන මාරුවී පැමිණි දිනය :- ....................................................................................

(III) වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :- ....................................................................................

(IV) පසුගිය ස්ථාන මාරු ලැබ ඒවා අත්හිටුවා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :- ..........................................

....................................................................................................................................

08) පෙර සේවා ස්ථාන හා සේවා කළ කාල සීමාවන් :-
(සේවයට ඇතුලත් වූ දිනයේ සිට වත්මන් සේවා ස්ථානයට පත්ව ආ දින තෙක් කලින් සේවය කර ඇති ස්ථාන අනුපිළිවෙලින් කාල සීමාවන්ද සමඟ දක්වන්න)

| කාල සීමාව | සේවා කාලය | සේවා ස්ථානය | වෙනත් කරුණු |
|---|---|---|---|
| | | | |

09) මාරුවීම් අපේක්ෂා කරන කාර්යාල තුනක් අනු පිළිවෙලින් (අපේක්ෂා නොකරන්නේ නම් ඒ බව සඳහන් කරන්න)

(I) ....................................................................................................................

(II) ....................................................................................................................

(III) ....................................................................................................................

10) සේවයේ අවශ්‍යතාවය මත මාරු කරුනු ලැබුව හොත් , මාරුවී යාමට කැමති ස්ථාන තුනක් අනුපිළිවෙලින්

(I) ....................................................................................................................

(II) ....................................................................................................................

(III) ....................................................................................................................

11) ස්ථාන මාරුවීමක් ඉල්ලීමට හේතු :- ....................................................................................

....................................................................................................................................

....................................................................................................................................

12) ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ නම් වත්මන් සේවා ස්ථානයේ රැඳී සිටීමට හේතු :-

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

13) පූර්ණ වෘත්තිය සුදුසුකම් ලබා ගැනීමේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධාරින් විසින් පිරවීම සඳහා

| උපාධිය හා සමාන සුදුසුකම් ලබා ගත් දිනය | දෙපාර්තමේන්තුවේ මුල් පත්වීමේ දිනය | ලබා ඇති පළපුරුද්ද (මාස) | | |
|---|---|---|---|---|
| | | සැලසුම් | ඉදිකිරීම් | වෙනත් |
| | | | | |

මා විසින් ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බවට සහතික කරන අතර , අසත්‍ය තොරතුරු ප්‍රකාශ කර ඇති බව හෙලිවුවහොත් මා හට විරුද්ධව ක්‍රියා කල හැකි බව මම දනිමි.

............................
දිනය

.............................................................
නිලධාරියාගේ / නිලධාරිනියගේ අත්සන

**අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්/ වාරිමාර්ග අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ (යාන්ත්‍රික)/ ව්‍යාපෘති අධ්‍යක්ෂ /නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු/ ප්‍රධාන නේවාසික ඉංජිනේරු / ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු/ නේවාසික ඉංජිනේරු/ යාන්ත්‍රික ඉංජිනේරු ගේ නිර්දේශය :**

<u>වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත,</u>

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ..................... ශ්‍රේණියේ ඉංජි ............................................................................................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මා යටතේ සේවය කරන අතර, ඔහුගේ /ඇයගේ ප්‍රකාශයේ සඳහන් තොරතුරු කාර්යාල ලේඛන සමග හැකිතාක් දුරට පරීක්ෂා කළ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

..........................................................................
දිනය

.............................................................................
අති.වා.අ.ජ./ වාරි.අධ්‍ය./ අධ්‍ය-යාන්ත්‍රික/ ව්‍යා.අධ්‍ය./
නි.ව්‍යා.අ./ ප්‍ර.ඉ./ප්‍ර.යා.ඉ./ ප්‍ර.නේ.ඉ./ ප්‍රා.වා.ඉ. /
නේ.ඉ./ යා.ඉ.
අත්සන හා නිලමුද්‍රාව

ඇමුණුම 02

# වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## වාර්ෂික ස්ථාන මාරුවීම් - 2024 (ඉංජිනේරු සේවය)

අංශය /කලාපය ................................................................

| 1<br>අනු අංකය | 2<br>නම සහ ස්ථිර ලිපිනය | 3<br>දැනට සිටින පන්තිය ශ්‍රේණිය | 4<br>උපන් දිනය හා 2023-12-31 දිනට වයස | 5<br>විවාහක අවිවාහක බව | 6<br>කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය | 7<br>දරුවන් ගණන | 8<br>පෙර සේවා ස්ථාන හා එහි සේවා කාලය | 9<br>වර්තමාන සේවා ස්ථානය හා එහි සේවා කාලය | 10<br>ස්ථාන මාරු අපේක්ෂිත ස්ථාන හෝ අපේක්ෂා නොකරන්නේ නම් ඒ බව | 11<br>සේවා අවශ්‍යතාව මත මාරු කරන්නේ නම් කැමති ස්ථාන | 12<br>වෙනත් කරුණු | 13<br>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |

ඇමුණුම 03

# වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## වාර්ෂික ස්ථාන මාරුවීම් - 2024 (ඉංජිනේරු සේවය)

අංශය/ කලාපය ..............................................................

| කාර්යාලයේ නම | අනුමත නිලධාරීන් ගණන | 2024 වසරට අවශ්‍ය නිලධාරීන් ගණන (a) | දැනට සිටින නිලධාරීන් ගණන (b) | ඌණතාවය (a-b) | අතිරික්තය (b-a) |
|---|---|---|---|---|---|
| | | | | | |